# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ගිණුම්කරණය - 33

### නිපුණතාව 08

ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා


ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය

වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 8.1 ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ගිණුම් තැබීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | • ලාභ අරමුණු කර නොගත් සංවිධාන හැඳින්වීම.<br>• ගිණුම් තැබීමේ අවශ්‍යතාව<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධාන පවත්වා ගන්නා ගිණුම් | • ලාභ අරමුණු කර නොගත් සංවිධාන පැහැදිලි කරයි.<br>• ගිණුම් තැබීමේ අවශ්‍යතාව දක්වයි.<br>• සංවිධානයක පවත්වා ගන්නා ගිණුම් පැහැදිලි කරයි. |
| 8.2. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය අනාවරණය කරයි. | • සාමාජික මුදල්<br>• සමුච්චිත අරමුදල<br>• පරිත්‍යාග<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධානවල මූල්‍ය ප්‍රකාශන<br>• ආදායම් ප්‍රකාශනය<br>• මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | • සාමාජික මුදල් ගිණුම පිළියෙල කරයි.<br>• යාවජීව සාමාජික මුදල් ගිණුම් ගත කරයි.<br>• පරිත්‍යාග ගිණුම්ගත කරන ආකාරය පැහැදිලි කරයි.<br>• සමුච්චිත අරමුදල යන්න පැහැදිලි කර, ගණනය කරයි.<br>• ලාභ අරමුණු කර නොගත් සංවිධාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. |

# ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

**සංකල්ප සිතියම**



**• සාමාජික හා සමාජ සුභ සාධනයට හා අභිවෘද්ධිය අරමුණු කර ගත් සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්වේ.**

නිදසුන් :
- ක්‍රීඩා සමිති, සංවිධාන
- අවමංගල්‍යාධාර සමිති
- තරුණ සංවිධාන
- ආගමික සංවිධාන
- යනාදිය

**• ගිණුම් තැබීමේ අවශ්‍යතාව**

• ලාභ අරමුණක් නැතත් මෙවැනි සංවිධාන ආර්ථිකමය කටයුතුවල දී නිරත වේ. එමෙන්ම සාමාජිකයිගේ මුදල් ලබා ගනියි. මෙවැනි ආර්ථිකමය කටයුතුවල නිරත වන බැවින් ඒ පිළිබඳ නිවැරදි තොරතුරු සාමාජිකයන්ට ලබාදීම සඳහා ගිණුම් තැබීමක් අවශ්‍ය වේ.

**• ලාභ අරමුණු කර නොගත් සංවිධාන සකස් කරන ගිණුම් හා වාර්තා**
- ලැබීම් හා ගෙවීම් ගිණුම/මුදල් ගිණුම
- සාමාජික මුදල් ගිණුම
- ආදායම් හා වියදම් ගිණුම / ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- බාහිර ක්‍රියාකාරකම්වලින් සිදු වන ප්‍රථිඵල ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම.

• ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රධාන ආදායම් මාර්ගය සාමාජික මුදල් බැවින් ඒ සඳහා සාමාජික මුදල් ගිණුමක් පවත්වා ගනියි.

- **සාමාජික මුදල් ගිණුමේ අන්තර්ගත තොරතුරු ලෙස**
  - වර්ෂය ආරම්භක දිනට - හිඟ හිටි සාමාජික මුදල්
    - කලින් ලද සාමාජික මුදල්
  - වර්ෂය අවසාන දිනට - හිඟහිටි සාමාජික මුදල්
    - කලින් ලද සාමාජික මුදල්
  - වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල්
  - වර්ෂයට අදාළ සාමාජික මුදල

| සාමාජික මුදල් ගිණුමක ආකෘතිය | | | |
|---|---|---|---|
| ඉ/ගෙනා හිග සාමාජික මුදල් | XX | ඉ/ගන ආ කලින් ලද සාමා මුදල් | XX |
| ආදායම් වියදම් ගිණුමට | XXX | ලැබූ සමාජික මුදල් | XXX |
| | | | |
| ප/ගෙ කලින් ලද සාමා මුදල් | XX | ප/ගෙ හිග සමා මුදල් | XX |
| | XXX | | XXX |
| ඉ/ගන ආ කලින් ලද සාමා මුදල් | XX | ඉ/ගෙනා හිග සාමාජික මුදල් | XX |

## ලැබීම් හා ගෙවීම් ගිණුම / මුදල් ගිණුම

ගිණුම් කාලච්ඡේදය තුළ සංවිධානයට මුදලින් ලැබූ හා සංවිධාන විසින් මුදලින් ගෙවූ වටිනාකම පමණක් සාරාංශ කර ඇතුළත් කරන ගිණුම, ලැබීම් ගෙවීම් ගිණුමයි. මෙය මුදල් පදනමට පිළියෙල කරයි.

| ක්‍රීඩා සමාජයක ලැබීම් හා ගෙවීම් ගිණුමක ආකෘතිය | | | |
|---|---|---|---|
| ඉ/ගෙ ආ ශේෂය | XX | උත්සව වියදම් | XX |
| සමාජික මුදල් | XXX | ක්‍රීඩා උපකරණ මිලට ගැණුම් | XX |
| පරිත්‍යාග | XX | පුහුණු වියදම් | XX |
| ඇතුලත්වීමේ ගාස්තු | XX | කිඩා පිටි නඩත්තු වියදම් | XX |
| යාවජීව සාමාජික මුදල් | XX | තරග වියදම් | XX |
| පත්තර විකිනීමෙන් | X | විදුලි / දුරකථන වියදම් | XX |
| ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් | XX | වැටුප් | XX |
| ක්‍රීඩා තරග ආදායම් | XX | ලිපිද්‍රව්‍ය වියදම් | XX |
| | | පුවත්පත් මිලට ගැණුම් | X |
| | | ප/ගෙ ශේෂය | XX |
| | XXXX | | XXXX |
| ඉ/ගෙ ශේෂය | XX | | |

**ආදායම් හා වියදම් ගිණුම /(ආදායම් ප්‍රකාශනය)**

කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් ඇතුළත් කර සකස් කරන ගිණුම ආදායම් හා වියදම් ගිණුම වේ. මෙය **උපචිත පදනමට** පිළියෙල කරයි. මෙහි ප්‍රතිඵලය **අතිරික්තය** හෝ **ඌණතාව** ලෙස හැඳින්වේ. මෙහි ආදායම් බැරටත් වියදම් හරටත් සටහන් කර , කාලච්ඡේදයේ වියදමට වඩා වැඩි ආදායම් ප්‍රමාණය **අතිරික්තය** ලෙස හැඳින්වේ. මෙම අතිරික්ත එක් රැස්වීමෙන් ගොඩ නැගෙන අරමුදල **සමුච්චිත** අරමුදල ලෙස හැඳින්වේ. කාලච්ඡේදයේ වියදමට වඩා ආදායම් ප්‍රමාණය අඩු නම් එම අඩු වූ ප්‍රමාණය **ඌණතාව** ලස හැඳින්වේ.

මෙය ආදායම් ප්‍රකාශයක් ලෙසද පිළියෙළ කළ හැක.

| ක්‍රීඩා සමාජයක ආදායම් හා වියදම් ගිණුමක ආකෘතිය | | | |
|---|---|---|---|
| උත්සව වියදම් | xx | සමාජික මුදල් | xx |
| කිඩා පිටි නඩත්තු වියදම් | xx | පරිත්‍යාග | xx |
| පුහුණු වියදම් | xx | ඇතුලත්වීමේ ගාස්තු | xx |
| තරග වියදම් | xx | යාවජීව සාමාජික මුදල් | xx |
| විදුලි / දුරකථන වියදම් | xx | පත්තර විකිනීමෙන් | xx |
| වැටුප් | xx | ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් | xx |
| ලිපිද්‍රව්‍ය වියදම් | xx | ක්‍රීඩා තරග ආදායම් | xx |
| පුවත්පත් මිලට ගැණුම් | x | | |
| දේපල පිරියත උපකරණ ක්ෂය | xx | | |
| අතිරික්තය | xx | ඌණතාවය | xx |
| | xxx | | xxx |

## සමුච්චිත අරමුදල

අතිරික්තය නිසා වැඩි වන අතර ඌණතාවය නිසා අඩු වේ. සෑම වසරක ම අතිරික්ත එකතු වීමෙන් සමුච්චිත අරමුදල ගොඩ නැගේ. එමෙන් ම නිශ්චිත දිනකට පැවැති මුළු වත්කම් වටිනාකමෙන් මුළු වගකීම් වටිනාකම අඩු කර සමුච්චිත අරමුදල ගණනය කරයි.

## බාහිර ක්‍රියාකාරකම්

ලාභ අරමුණු කර නොගත් සංවිධාන සිය දියුණුව හා සංවර්ධනය කර ගැනීමේ අරමුණින් ප්‍රධාන අරමුණට අමතරව ලාභ අරමුණු සහිත ව බාහිර ක්‍රියාකාරකම්වල නිරත වේ.

නිදසුන් :

- ආපනශාලා පවත්වා ගෙන යාම
- ක්‍රීඩා තරග පැවැත්වීම
- නාට්‍ය සංදර්ශන පැවැත්වීම

යනාදිය දැකවී ය හැකයි . මේවායේ ප්‍රතිඵල වෙන ම ගණනය කර, එය ආදායම් ප්‍රකාශනයට / ආදායම් හා වියදම් ගිණුමට ඇතුළත් කළ යුතු ය.

**<u>යාවජීව සාමාජික මුදල්</u>**

සංවිධානයේ සාමාජිකයන් මුළු ජීවිත කාලය සඳහා ම එකවර මුදලක් ගෙවා ලබාගන්නා සාමාජිකත්වය වෙනුවෙන් ලැබෙන මුදුල් **යාවජීව සාමාජික** මුදල් ලෙස හැඳින්වේ. මෙය එකවර ලැබෙන මුදලක් බැවින්, වර්ෂයට අදාළ ව සමිතිය තීරණය කරන යම් ප්‍රමාණයක් ආදායමක් සේ සලකා, ඉතරි ය ඉදිරි කාලච්ඡේද සඳහා බෙදාහැරීමට අරමුදලක් සේ පවත්වා ගැනීම බොහෝ දුරට සිදු වේ.

## පරිත්‍යාග

**ලාභ අරමුණු කර නොගත් ආයතනවලට විවිධ පරිත්‍යාග ලැබේ. මෙවැනි ලැබෙන පරිත්‍යාග සාමාන්‍ය පරිත්‍යාග සහ විශේෂ පරිත්‍යාග ලෙස කොටස් දෙකකට වර්ග කළ හැකි ය. සාමාන්‍ය පරිත්‍යාග යනු ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වා ගැනීමට ලැබෙන පරිත්‍යාග වේ.**

**සාමාන්‍ය පරිත්‍යාග ගිණුම්ගත කිරීම :**

**ලැබීම් හා ගෙවීම් ගිණුම හර**

**ආදායම් වියදම් ගිණුම බැර**

එනම් සාමාන්‍ය පරිත්‍යාග ලැබෙන වර්ෂයේ ආදායමක් ලෙස වාර්තා කෙරේ. කිසියම් නිශ්චිත කටයුත්තක් හෝ අරමුණක් සඳහා පරිත්‍යාග ලැබේ නම් එය විශේෂ පරිත්‍යාගයක් වශයෙන් හැඳින්වේ. උදා : ලෙස රු. ලක්ෂ 20 ක වටිනාකමින් යුත් මෝටර් රථයක් පරිත්‍යාගයක් ලෙස ලැබීම දැක්විය හැකි ය.

මෙවැනි විශේෂ පරිත්‍යාග ලැබෙන වර්ෂයේ සම්පූර්ණයෙන් ම ආදායමක් ලෙස සාමාන්‍යයෙන් නොගනියි. ඒ අනුව ඉහත උදාහරණයට අනුව මෝටර් රථ පරිත්‍යාගය පහත ලෙස ගිණුම් තැබිය හැකි ය.

මෝටර් රථ ගිණුම හර

පරිත්‍යාග ගිණුම බැර

පරිත්‍යාග ගිණුමේ ශේෂය කොටස් වශයෙන් ආදායමට හඳුනාගත හැකිය. එය ආයතනයේ කළමනාකාරිත්වය තීරණය කළ යුතු ය. එසේ කොටස් වහයෙන් ආදායමට හඳුනා ගන්නා විට,

පරිත්‍යාග ගිණුම හර

ආදායම් වියදම් ගිණුම බැර

ලෙස සටහන් කළ යුතු ය.

පරිත්‍යාග ගිණුමේ ඉතිරි ඉතිරි ශේෂය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල යටතේ පෙන්නුම් කළ යුතු ය.

**(සමිති අභ්‍යාස 01)**

නිදසුන : 2019 වර්ෂයේ ආරම්භක කරන ලද ශක්ති ක්‍රීඩා සංගමයේ ගනුදෙනු / තොරතුරු පහත දැක්වේ.

සාමාජික සංඛ්‍යාව - 200

| | |
|---|---|
| • එක් අයකුගේ වාර්ෂික සාමාජික මුදල | 100 |
| • විදුලි බිල ගෙවීම | 1 000 |
| • පුවත්පත් මිලට ගැණුම් | 300 |
| • සංග්‍රහ වියදම් | 250 |
| • පරිත්‍යාග ලැබීම් | 15 000 |
| • ක්‍රීඩා පිටිය පිරිසිදු කිරීමට | 2 000 |
| • සන්නිවේදන ගාස්තු | 1 500 |
| • ගෙවිය යුතු සේවක වැටුප් | 8 000 |
| • ලිපිද්‍රව්‍ය වියදම | 2 500 |
| • ක්‍රීඩා තරග වියදම | 12 000 |
| • ක්‍රීඩා පිටිය නවීකරණය (වැටක් සවි කිරීමට) | 15 000 |
| • ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් | 80 000 |
| • පරණ පත්තර විකිණීමෙන් | 200 |
| • ආපනශාලා ආදායම් | 20 000 |
| • ආපනශාලා වියදම් | 12 000 |
| • ලැබූ සාමාජික මුදල් වර්ෂය සඳහා | 18 000 |
| • ලී බඩු ණයට ගැණුම් | 20 000 |

අවශ්‍ය වන්නේ

1) ලැබීම් හා ගෙවීම් ගිණුම

2) ආදායම් හා වියදම් ගිණුම

**(සමිති අභ්‍යාස 02)**

අ) ශක්ති ක්‍රීඩා සමාජයේ 2018-12-31 න් අවසන් වර්ෂයට අදාලව සාමාජික මුදල් පිළිබඳ තොරතුරු පහත දක්වේ.

2018-01-01 -හිග සමාජික මුදල් 12 000

කලින් ලද සාමාජික මුදල් 7 000

වර්ෂය තුළ එකතුකරගත් සාමාජික මුදල් 70 000

2018-12-31 හිග සමාජික මුදල් 8 000

කලින් ලද සාමාජික මුදල් 5 000

ආදායම් හා වියදම් ගිණුමට ගෙනයන සාමාජික මුදල සොයන්න

ආ) අරුණ ක්‍රීඩා සමාජයේ 2018-12-31 න් අවසන් වර්ෂයට අදාලව සාමාජික මුදල් පිළිබඳ තොරතුරු පහත දක්වේ.

සමිතියේ සාමාජික සංඛ්‍යාව 250

එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු 500 කි

2018-01-01 -හිග සමාජික මුදල් රු 20 000

කලින් ලද සාමාජික මුදල් 8 000

සාමාජිකයන් 20 දෙනෙකු 2019 වර්ෂයටත් මුදල් ගෙවා ඇති අතර , සාමාජිකයන් 25 දෙනෙකු වර්ෂයට අදාලව මුදල් ගෙවිය යුතුව ඇත.

2018 වර්ෂයට අදාල සාමාජික මුදල් ගිණුම පිළියෙල කරන්න.

**ඉ) සිංහ ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් පිළිබඳ විස්තර මෙසේය**

**වර්ෂය තුළ සමාජික මුදල් රු 220 000 භාණ්ඩාගාරික විසින් එකතු කරන ලදී. මෙම මුදල් තුළ 2017 වර්ෂයට අදාල සාමාජිත මුදල් රු 15 000 ක්ද 2019 වර්ෂයට අදාල සාමාජික මුදල් රු 10 000 ක් ද වේ. 2018 වර්ෂයට නොලැබුනු සාමාජික මුදල් රු 25 000 කි. වර්ෂය ආරම්භයේ කලින් ලද සාමජික මුදල් නොවීය. 2018 වර්ෂයට අදාල සාමාජික මුදල් ගිණුම පිළියෙළ කරන්න.**

**(සමිති අභ්‍යාස 03)**

සුහද ක්‍රීඩා සමාජයේ 2018 වරෂයය සඳහා පහත තොරතුරු භාණ්ඩාගාරික විසින් සපයන ලදී

2018/01/01 පැවැති වත්කම් හා වගකීම්

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 200 000 |
| ක්‍රීඩා උපකරණ | 100 000 |
| ගෘහ භාණ්ඩ | 50 000 |
| හිග සාමාජික මුදල් | 15 000 |
| ඉදිරියට ගෙවන ලද සාමාජික මුදල් | 10 000 |
| මුදල් ශේෂය | 10 000 |

පහත සඳහන් ආදායම් හා වියදම් වරෂයය තුල සිදුවිය

| | |
|---|---|
| එකතුකරගත් සාමාජික මුදල් | 60 000 |
| ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් | 50 000 |
| පුවත්පත් අලෙවියෙන් | 7 000 |
| උත්සව වියදම් | 10 000 |
| පුහුණු කිරීමේ වියදම් | 5 000 |
| තෑගි සඳහා වියදම් | 20 000 |

ගෘහ භාණ්ඩ 10% ක් ද / ක්‍රීඩා උපකරණ 20% ක් ද පිරිවැයට ක්ෂය කලයුතු අතර / 2018-12-31 දිනට හිග සාමාජික මුදල් රු 20 000 ක් ද ඉදිරියට ගෙවූ සාමාජික මුදල් රු 5 000 ක් ද වේ

අවශ්‍යය වන්නේ

2018-12-31 දිනෙන් අවසන් වරෂයය සඳහා

1 ලැබීම් හා ගෙවීම් ගිණුම 2 ආදායම් හා වියදම් ගිණුම (ආදායම් ප්‍රකාශය) 3 සාමාජික මුදල් ගිණුම

4 එදිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

**(සමිති අභ්‍යාස 04)**

ශක්ති ක්‍රීඩා සමාජයේ 2018 වරඝෂය සඳහා පහත තොරතුරු භාණ්ඩාගාරික විසින් සපයන ලදී

2018/01/01 පැවැති වත්කම් හා වගකීම්

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 |
| ක්‍රීඩා උපකරණ | 200 000 |
| ගෘහ භාණ්ඩ | 60 000 |
| හිග සාමාජික මුදල් | 25 000 |
| ඉදිරියට ගෙවන ලද සාමාජික මුදල් | 15 000 |
| මුදල් ශේෂය | 50 000 |

පහත සඳහන් ආදායම් හා වියදම් වරඝෂය තුල සිදුවිය

| | | |
|---|---|---|
| එකතුකරගත් සාමාජික මුදල් | 75 000 | |
| ප්‍රවේශ පත්‍ර අලෙවියෙන් | | 50 000 |
| පුවත්පත් අලෙවියෙන් | 7 000 | |
| උත්සව වියදම් | 10 000 | |
| පුහුණු කිරීමේ වියදම් | 5 000 | |
| තෑගි සඳහා වියදම් | 20 000 | |

ගෘහ භාණ්ඩ 10% ක් ද / ක්‍රීඩා උපකරණ 20% ක් ද පිරිවැයට ක්ෂය කලයුතු අතර / 2018-12-31 දිනට හිග සාමාජික මුදල් රු 16 000 ක් ද ඉදිරියට ගෙවූ සාමාජික මුදල් රු 7 000 ක් ද වේ

අවශ්‍යය වන්නේ

2018-12-31 දිනෙන් අවසන් වරඝෂය සඳහා

1 ලැබීම් හා ගෙවීම් ගිණුම 2) ආදායම් හා වියදම් ගිණුම (ආදායම් ප්‍රකාශය) 3) සාමාජික මුදල් ගිණුම 4 එදිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

**(සමිති අභ්‍යාස 05)**

නිදසුන : සුමග සුභ සාධක සංගමයේ 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ සිදු වූ මුදල් ලැබීම් හා ගෙවීම් මෙසේ ය.

මුදල් ගිණුම / ලැබීම් හා ගෙවීම් ගිණුම

(රු.)

| | | | |
|---|---|---|---|
| 2016/04/01 අතැති මුදල් | 50 000 | නඩත්තු වියදම් | 20 000 |
| සාමාජික මුදල් | 50 000 | ආපනශාලා ආහාර | 60 000 |
| ආපනශාලා ලැබීම් | 100 000 | දුරකථන ගාස්තු | 10 000 |
| යාවජීව සාමාජික මුදල් | 60 000 | සේවක වැටුප් | 70 000 |
| ඇතුළත්වීමේ ගාස්තු | 20 000 | ලිපි ද්‍රව්‍ය | 15 000 |
| වත්කම් කුලියට දීමෙන් | 55 000 | ආපනශාලා වියදම් | 8 000 |
| | | මුද්‍රණ වියදම් | 10 000 |
| | | පුවත්පත් | 2 000 |
| | | ක්‍රීඩා වියදම් | 12 000 |
| | | බැංකු ණය ගෙවීම් | 20 000 |
| | | 2017/03/31 ශේෂය | 108 000 |
| | 335 000 | | 335 000 |

2016/04/01 දිනට පැවැති ශේෂ

| | රු. |
|---|---|
| ගොඩනැගිල්ල | 100 000 |
| ක්‍රීඩා පිටිය | 250 000 |
| ලී බඩු | 50 000 |
| බැංකු ණය | 200 000 |

**අනෙකුත් තොරතුරු**

1. 2016/04/01 සිට යාවජීව සාමාජිකත්වය ක්‍රියාත්මක කළ අතර එම මුදලින් රු. 4 000 ක් පමණක් වසරේ ආදායම වශයෙන් හඳුනා ගැනේ.
2. ඇතුළත්වීමේ ගාස්තුවෙන් 2 000 ක් පමණක් වර්ෂයේ ආදායමක් සේ හඳුනා ගැනේ.
3. වාර්ෂික සාමාජික ගාස්තුව එක් අයෙකුගේ රු. 1000/- කි. 2017. 03. 31 දිනට සංගමයේ සාමාජික සංඛ්‍යාව 50 කි. මෙම වර්ෂය තුළ නව සාමාජිකයින් 15 දෙනෙකු බඳවා ගත් අතර, එයින් පස් දෙනෙක් යාවජීව සාමාජිකයෝ වෙති. එක් අයකුගේ යාවජීව සාමාජික ගාස්තුව රු. 12 000/- කි.
4. 2015/2016 සඳහා ලද සාමාජික මුදල රු. 7 000 ක්ද, 2017/2018 සඳහා ලද සාමාජික මුදල් 5 000 ක් ලැබූ සාමාජික මුදල්වල අන්තර්ගත වේ.

5. 2016/04/01 දිනට ආපනශාලා ආහාර තොගය රු. 12 000 ක් වූ අතර, 2017/03/31 දිනට රු. 10 000 ක ආහාර තොගයක් විය. එදිනට ලී බඩුවල වටිනාකම 10% කින් අඩු වී ඇත.

6. සේවක වැටුප්වලින් 20% ක් ආපනශාලා සේවකයින්ට අදාළ වේ.

7. පහත දෑ පිළියෙල කරමු. 2017/03/31 න් අවසන් වර්ෂයේ

1. සාමාජික මුදල් ගිණුම

2. බාහිර ක්‍රියාකාරකම් ප්‍රතිඵල ගණනය කිරීම 3. ආදායම් ප්‍රකාශනය / ආදායම් හා වියදම් ගිණුම

4. 2016/04/01 දිනට සමුච්චිත අරමුදල 5. 2017/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

**(සමිති අභ්‍යාස 06)**

ජන සරණ සුභ සාධක සමිතියේ 2019-09-30 න් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශය හා වත්කම් වගකීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ආදායම් ප්‍රකාශය** **රු.**

| | | | |
|---|---|---|---|
| සාමාජික මුදල් | | 120 000 | |
| ඇතුලත්වීමේ ගාස්තු | | 3 000 | |
| පරණ පත්තර විකුණුම් | | 7 000 | 130 000 |
| අඩුකලා වියදම් | උපකරණ ක්ෂය | 2 200 | |
| | රක්ෂණය | 1 800 | |
| | විදුලිය | 2 000 | |
| | ප්‍රචාරණය | 10 000 | |
| | සාමාජික දින වියදම් | 3 500 | |
| | පත්තර මිලට ගැණුම් | 1 500 | |
| | දුරකථන | 200 | (23 000) |
| අතිරික්තය | | | **107 000** |

අතිරේක තොරතුරු
කාලච්ඡේදයේ වත්කම් හා වගකීම් විස්තර

| | 2018-10-01 දිනට | 2019-09-30 දිනට |
|---|---|---|
| හිග සාමාජික මුදල් රු | 13 000 | 18 000 |
| කලින් ලද සාමාජික මුදල් රු | 7 000 | 9 000 |
| උපකරණ රු | 77 200 | 75 000 |
| උපචිත වියදම් රු | 3 000 | 4 000 |
| ඉදිරියට කළ ප්‍රචාරණය රු | 7 000 | 6 000 |
| මුදල් රු | 38 000 | 146 200 |
| | | |

අවශ්‍ය වන්නේ 1) ලැබීම් ගෙවීම් ගිණුම 2) 2019-09-30 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

**(සමිති අභ්‍යාස 07)**

දිවුල ටෙනිස් ක්‍රීඩා සමාජයේ **2018-12-31**වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | 46 000 | ක්‍රීඩාපිටි නඩත්තු වියදම | 10 000 |
| වාර්ෂික සාමාජික ගාස්තු | 29 400 | ආපන ශාලා ආහාර | 40 000 |
| ආපන ශාලාවෙන් ලැබීම් | 130 000 | සන්නිවේදන ගාස්තු | 12 000 |
| ක්‍රීඩාංගනය කුලියට දීමෙන් | 100 000 | වැටුප් | 180 000 |
| යාවජීව සාමාජික ගාස්තු | 60 000 | ලිපි ද්‍රව්‍ය | 8 000 |
| | | ආපනශාලා වියදම් | 7 000 |
| | | මුද්‍රණ වියදම් | 8 000 |
| | | ක්‍රීඩා තරග වියදම් | 12 000 |
| | | පුවත්පත් වියදම් | 5 000 |
| | | ප/ගෙ/ශේෂය | 83 400 |
| | 365 400 | | 365 400 |
| ඉ/ගෙ/ශේෂය | 83 400 | | |

**2018-01-01** දිනට තිබූ වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | (රු) |
|---|---|
| ක්‍රීඩා උපකරණ | 80 000 |
| ක්‍රීඩා පිටිය | 300 000 |
| ලී බඩු උපකරණ | 60 000 |
| ක්‍රීඩාගාරය | 200 000 |
| බැංකු ණය | 300 000 |

අමතර තොරතුරු

1. යාවජීව සාමාජිකත්වය **2018-01-01** දින සිට ලබා දෙන ලද අතර ක්‍රීඩා සමාජයේ ප්‍රතිපත්තිය වන්නේ වසර 10ක කාල සීමාවක් තුළ මෙම සාමාජික මුදල් බෙදාහැරීමයි.
2. වාර්ෂික සාමාජික ගාස්තුව රු 600ක් වන අතර යාවජීව සාමාජික ගාස්තුව රු 6 000කි. ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් 60 දෙනෙකු ඇති අතර ඔවුන් 10 දෙනෙකු යාවජීව සාමාජික වෙති.
3. **2017** වසරේ **හිඟ** සමාජික ගාස්තු රු 6 000ක්ද **2019** වසර සඳහා කලින් ලැබූ රු 3 000ක්ද සාමාජික ගාස්තුවල ඇතුලත් වේ.
4. දිවුල ක්‍රීඩා සමාජයේ සාමාජිකයන් වෙනුවෙන් ආපන ශාලාවක් පවත්වාගෙන යන අතර එහි **2018-01-01** දින ආහාර තොගය රු 10 000 ක් වන අතර **2018-12-31**දිනට ආහාර තොගය 8 000ක් ද ලී බඩු උපකරණ 50 000ක්ද විය.
5. වැටුප් විශ්ලේෂණය පහත දැක්වේ.

| | (රු) |
|---|---|
| ආපන ශාලා කළමනාකරුට | 40 000 |
| ක්‍රීඩාංගන භාරකරු 01 | 40 000 |
| ක්‍රීඩාංගන භාරකරු 02 | 40 000 |
| ක්‍රීඩා පිටි සේවකයන් සඳහා | 60 000 |
| | 180 000 |

**අවශ්‍ය වන්නේ**

(1) 2018-01-01 දිනට **මූල්‍ය තත්ව ප්‍රකාශය**

(2) **2018-12-31** දිනට යාවජීව සාමාජික ගාස්තු ගිණුම

(3) ආපන ශාලාවේ **2018-12-31** අවසන් වර්ෂය සඳහා ලාභය

(4) **2018-12-31** දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය (ලකුණු 09)

(සමිති අභ්‍යාස 08)

(ආ) මහේෂිකා කාන්තා සංගමය සාමාකාවන් සඳහා ස්වයං රැකියා ණය සපයන අතර හදිසි ආපදා අවස්ථාවන්හිදී, මුදල් ආධාර ද සපයනු ලැබේ.

මෙහි අරමුදල් තර කර ගැනීම සඳහා සාමාක මුදල්වලට අමතරව සාමාකාවන්ගේ ශ්‍රම දායකත්වයෙන් රෙදි අත්බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක් ද පවත්වා ගෙන යයි. මේ සඳහා ශ්‍රමය සපයන සාමාජිකාවන්ට සාධාරණ වැටුපක් ද ගෙවනු ලැබේ.

ඉහත සංගමයේ තොරතුරුවලින් තෝරාගත් තොරතුරු අයිතම කිහිපයක් පහත පරිදි වේ.

| | |
|---|---|
| 1. මුදල් ලැබීම් | රු |
| සාමාක මුදල් | 300 000 |
| ණය පොලි ලැබීම් | 80 000 |
| සාමාන්‍ය පරිත්‍යාග | 200 000 |
| 2. මුදල් ගෙවීම් | රු |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම් | 350 000 |
| මැහුම් හලේ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 113 100 |
| පරිපාලන වියදම් | 300 000 |
| බෑග් විකිණීමේ වියදම් | 50 000 |
| හදිසි ආපදා ආධාර | 250 000 |

| 3. වත්කම් හා වගකීම් | 2018.03.31 (රු) | 2017.04.01 (රු) |
|---|---|---|
| මහන යන්ත්‍ර - ධාරණ අගය | 450 000 | 500 000 |
| අමුද්‍රව්‍ය | 41 000 | 43 000 |
| කලින් ලද සාමාජික මුදල් | 15 000 | 20 000 |
| හිccs සාමාජික මුදල් | 30 000 | 10 000 |

4. මසා නිමි බෑග් 200ක් 2017.04.01 දිනට තිබූ අතර, එකක නිෂ්පාදන පිරිවැය රු 300කි. 2018.03.31 දිනට ඉතිරි බෑග් ගණන 400 කි.

5. වර්ෂය තුළ නිපදවන ලද මුලු බෑග් සංඛ්‍යාව ඒකක 2020 කි.

6. එක් බෑගයක් නිම කිරීම සඳහා සේවිකාවකට රු 50ක් ගෙවනු ලැබේ. වර්ෂය තුළ මෙතෙක් මේ සඳහා ගෙවීම් කර නැත.

7. පරිපාලන වියදම්වලින් 1/3ක් මැහුම් හළට අදාළ වේ.

8. බෑගයක විකුණුම් මිල රු 450කි.

අවශ්‍ය වන්නේ :

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ සකස් කිරීම

1. මැහුම් හලේ නිෂ්පාදන ගිණුම
2. මැහුම් හලේ ආදායම් ප්‍රකාශනය
3. කාන්තා සංගමයේ ආදායම් හා වියදම් ගිණුම